## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපන්තිය සඳහා වන සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය

(රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/02-01-34/04/2017 හා 2021.08.10 දිනැති ලිපිය අනුව 1.1, 1.2, 1.4, 1.6, 7.4.2.3, 7.4.2.5 සහ 7.4.5 වගන්ති සංශෝධනය කර ඇත.)

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
යොමු අංකය : ජාලේ 7/1/3/ 1 දිනය : 2017.03.02
DNA/2/MA7/2/11 දිනය : 2020.10.23

1.2 අමාත්‍යාංශය : අධ්‍යාපන අමාත්‍යාංශය
යොමු අංකය : ED/5/67/26/02/13 දිනය : 2017.04.11
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
යොමු අංකය : CA/1/1/18/6/1 දිනය : 2020.12.21

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/1135 Vol - I දිනය : 2016.09.15
DMS/1135 Vol - I 2017.02.08
DMS/1135 Vol - I 2017.02.17

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය : EST-02/RECRU/02/0295 දිනය : 2017.06.05
EST-02/RECRU/02/0295 දිනය : 2019.09.19

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : NSCC/5/38/SR (තාවකාලික) දිනය : 2017.05.31

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය : PSC/EST/02-01-34/04/2017 දිනය : 2017.11.28
PSC/EST/02-01-34/04/2017 පළමු සංශෝධනය : 2021.08.06

**02. පත් කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) අධිපන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුහසාධ්‍යකාරක/ උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය** : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

**05. වැටුප්**

5.1 වැටුප් කේත අංකය : MN 7 –2016